සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගයීම - 2018
,uz;lhk; jtiz kjpg;gPL - 2018
Second Term Evaluation - 2018

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 8 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I/II | පැය / மணித்தியாலம் / Hours: 02 |

නම
ngau; ------------------------------------------------------------------------
Name

සැලකිය යුතුයි

- I කොටසේ සියලු ම ප්‍රශ්නවලටත්
- II කොටසේ 1 හා 2 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න my1g පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

❖ 1 හා 2 ප්‍රශ්නවල ඉරි ඇඳි යෙදුම්වලට වඩාත් උචිත අර්ථය තෝරන්න.

(01) සමහර විචාරකයෝ නිර්මාණකරුවන් ගොනාට අන්දවති.

(1) පැසසුමට ලක් කරති (2) දැඩි විවේචනයට ලක් කරති
(3) මුලා කිරීමට උත්සහ දරති (4) විහිළුවට භාජනය කරති

(02) නව සභාපතිවරයා අල්ලේ නැටවීමට ඔවුන් දැරූ උත්සාහය අසාර්ථක විය.

(1) අවශ්‍ය පරිදි හැසිරවීමට (2) අවනත කර ගැනීමට
(3) මෙල්ල කිරීමට (4) පාලනය කිරීමට

❖ හිස්තැනට සුදුසු පදය තෝරන්න.

(03) යුව රජු ඇතුළු මුළු රාජ සභාව ම කලබලයට පත් ........................ (විය / වූහ )

(04) ..............................(ඔවුහු / ඔවුන් ) අලි වසුරුවලින් කඩදාසි නිෂ්පාදනය කරති.

(05) ගුරු උපදේශකවරු පැමිණ ආධුනික ...........................(ගුරුවරු / ගුරුවරුන්) හමුවූහ.

❖ නිවැරදි වාක්‍යය තෝරන්න

(06) (1) ගුරුතුමා ගීතයක් ගායනා කරති (2) නිර්මාණකරුවන් රැස්වීම අමතති
(3) ගුවන්යානාවෝ අහසේ පියාසර කරති (4) අයියාත් අක්කාත් වෙළෙඳපොළට යයි

(07) ඉදිරියෙන් දී ඇති ව්‍යාකරණ ගණයට අයත් නොවන පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) තද්ධිත පද - සාමාජික, කාලීන, හැකියා

(2) විශේෂණ පද - සෙමින්, රතු, උස

(3) යුගල පද - ඇත මැත, වංහුං, යාන වාහන

(4) උපසර්ග පද - සුහද, අවධි, ප්‍රබල

(08) දී ඇති බහ්වර්ථ පදවලට **නො ගැළපෙන** පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) නා - නාග, ඇතා, නායක
(2) දිය - ජලය, ලනුව, ලෝකය
(3) පිය - ප්‍රිය, පිහාටු, පාද
(4) වග - වරිග, තොරතුරු, වස

(09) ''දිය පිට ඇඳි ඉරක් වගෙයි'' යන පිරුළෙන් ප්‍රකාශ වන්නේ,

(1) දැඩි කැලඹීමකි (2) කල් නොපැවතීම
(3) කරදරයකට මුහුණ දීම (4) නිදහසක් නොමැති කම

(10) ''<u>තමා ගැන පමණක් සිතා කටයුතු කරන්නා</u> මුළු සමාජයටම පිළිලයකි.'' මෙහි ඉරි ඇඳි පදයේ තනි වචනය වන්නේ,

(1) ආත්මාර්ථකාමියා (2) පරාර්ථකාමියා
(3) රසකාමියා (4) අනර්ථකාමියා

(11) A- අරවින්ද - පංකජ, B - කිරණ - හිරු, C - කුසුම් - පුෂ්ප, D - මිතුරු - අරි

ඉහත ප්‍රකාශවල නිවැරදි සමානාර්ථ දෙන පිළිතුර වන්නේ,

(1) A-D ය (2) A-C ය (3) B-D ය (4) B-C ය

(12) ''වෙන වෙන හොඳ පාට ඇඳුම් - ඇඳගත් පොඩි ළමයි පෙළක්
වගෙයි නේද මේ ගස් ටික - නොයෙක් පාට මල් පිපිලා''

මෙහි සඳහන් වන උපමාවක් හා උපමේයක් වන්නේ,

(1) පාට ඇඳුම්- පොඩි ළමයි (2) පොඩි ළමයි - මල්
(3) පොඩි ළමයි - ගස්පෙළ (4) පාට ඇඳුම් - ගස්පෙළ

(13) ''අධිරාජයාණෙනි, අපි දැන සිටියේ නැහැ . එබඳු කිරිල්ලක ගැන.''

මෙහි යෙදී ඇති විරාම ලකුණු වර්ග ගණන කීය ද?

(1) 2 යි (2) 5 යි (3) 7 යි (4) 3 යි

(14) පහත සඳහන් නාම පද උචිත පරිදි වගුවේ ඇතුළත් කරන්න.

වැලි , පොල් , තරුණ , ලියුම්

| ජාති නාම | ගුණ නාම | ක්‍රියා නාම | ද්‍රව්‍ය නාම |
|---|---|---|---|
| | | | |

(15) A- පිපීයන් - ආශිර්වාද ක්‍රියා
B- බල - පූර්ව ක්‍රියා
C- පතිමින් - මිශ්‍ර ක්‍රියා
D- කපා - විධි ක්‍රියා

නිවැරදි ක්‍රියා පද ගැළපීම වන්නේ

(1) A හා D ය (2) A හා C ය (3) B හා C ය (4) C හා D ය

(16) පහත සඳහන් වචනවල හිස්තැනට ගැළපෙන අක්ෂර පිළිවෙළින් යෙදී ඇති පේළිය සොයන්න.

වර්◯ය , ප්‍රත්‍යක්◯ , කෘ◯ම , විශේ◯ංග

(1) ණ, ෂ, තී, සා (2) ණ, ෂ, ත්‍රි, ෂා (3) ණ, ෂ, තී, ශා (4) න, ශ, ත්‍රි, ෂා

(17) ප්‍ර◯පකාර , අ◯යස , ව◯පෙත , දේශා◯මානී

(1) ත්‍ය, බි, න, භි (2) ත්‍යු, භි, ණ, බි (3) ත්‍යු, බි, න, භි (4) ති, භි, ණ, භි

(18) ''සිංහල භාෂාවෙහි යෙදෙන වචනවල අරුත් දැන ගැනීමට ඉවහල් වන ප්‍රධාන කෘතිය සිංහල ශබ්ද කෝෂයයි.

ඉහත වැකියේ භාවිත මහාප්‍රාණ අක්ෂර ගණන කීය ද?

(1) 2යි (2) 1 යි (3) 3 යි (4) 4 යි

(19) අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) කළුතර, කෑගල්ල, කොළඹ, කුරුණෑගල (2) අන්නාසි, කෙසෙල්, මිදි, දං

(3) නිල්, රෝස, රතු, සුදු (4) කජු, ජම්බු, පේර, ලබු

(20) ගුණදාස අමරසේකරයන්ගේ නවකතාවකට උදාහරණයක් වන්නේ,

(1) යළි උපන්නෙමි ය (2) ජීවන සුවඳ ය (3) රතු රෝස මල ය (4) කතා පහක් ය

(ලකුණු 2 ×20 = 40)

## II කොටස

- 1 හා 2 ප්‍රශ්න අනිවාර්යය වේ. 3,4,5,6,7 ප්‍රශ්නවලින් තවත් ප්‍රශ්න තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

(01) පංති කාමරයේ දී කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සකස් කළ බිත්ති පුවත්පත ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) බිත්ති පුවත්පත සඳහා ඔබ කණ්ඩායම ඉදිරිපත් කළ නිර්මාණය කුමක් ද? (ලං:02 යි)

(ii) එම නිර්මාණය සඳහා කරුණු රැස් කළ ක්‍රම 3 ක් ලියන්න. (ලං:03 යි)

(iii) නිර්මාණකරණයේ දී ගුරුභවතාගෙන් ලද උපදෙස් දෙකක් ලියන්න. (ලං:02 යි)

(iv) ක්‍රියාකාරකම තුළ ඔබ මුහුණ දුන් ගැටලු 3ක් ලියන්න. (ලං:03 යි)

(v) ඔබ කණ්ඩායම තුළ දක්නට ලැබුණු ගුණාංග 3 ක් ලියන්න. (ලං:03 යි)

(vi) කණ්ඩායම් නිර්මාණ ක්‍රියාකාරකමින් ඔබ ලද කුසලතා 3 ක් ලියන්න. (ලං:03 යි)

(මුළු ලකුණු:16 යි)

(02) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150 ක පමණ රචනාවක් ලියන්න.

i. පරිසර පවිත්‍රතාව ආරක්ෂා කරමු
ii. ජන කවි සාහිත්‍යය
iii. නිරෝගීකම රකින ආහාර පාන
iv. මා කැමති සංස්කෘතික උත්සවය
v. මා ගිය විනෝද ගමනක්

(ලකුණු:14 යි)

(03) ඔබ විද්‍යාලයට 2019 වසර සඳහා කනිෂ්ඨ ශිෂ්‍යනායක මණ්ඩලයක් අලුතින් තෝරා ගැනීමට අදහස් කරයි. 8 ශ්‍රේණියේ ක්‍රියාකාරී සිසුවකු/සිසුවියක වන ඔබ ඒ සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන බැවින් විදුහල්පතිතුමා වෙත ඉදිරිපත් කරන ආකෘති පත්‍රය නිර්මාණය කරන්න.
(ලකුණු:10 යි)

නැතහොත්

''අපි වවමු - රට නගමු'' තේමාව යටතේ විද්‍යාලය තුළ අලුතින් ආරම්භ කිරීමට නියමිත ''ගොවිපළ '' සඳහා උපදෙස් ලබා දෙන ලෙස ඉල්ලා ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ නිලධාරි තුමා වෙත යවන ලිපිය සකස් කරන්න. (ඔබ, විද්‍යාලයේ පරිසර කමිටුවේ ලේකම් යයි සිතන්න)

(ලකුණු:10 යි)

(04) පෙළ පොත ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

''මම දැක්කා අධිරාජයාගේ ඇස්වලට කඳුළු උනනවා. එය මා ලද උසස් ම ත්‍යාගය යි.

(i) ඉහත පාඨය උපුටා ගත් පාඩම කුමක් ද?

(ii) එම පාඩම සැකසෙන්නේ කුමන කතාවක් ඇසුරෙන් ද?

(iii) ඉහත ප්‍රකාශය කරන්නේ කවු ද?

(iv) අධිරාජයාගේ ඇස්වලට කඳුළු නැගුණේ කුමක් නිසා ද?

(v) මෙම නිර්මාණය කළ කතාකරුවාගේ වෙනත් ළමා කතා දෙකක් නම් කරන්න.

(ලකුණු:2×5=10 යි)

(05) අක්ෂර වින්‍යාසය නිවැරදි පදය වරහන් තුළින් තෝරන්න. යටින් ඉරක් අඳින්න.

(i) ශබ්ද (විකාශණ, විකාශන ) යන්ත්‍රය

(ii) (සූර්ය, සූර්‍ය) රශ්මිය.

(iii) (මහලු, මහළු ) නිවාසය.

(iv) වාර්ගික (අර්භුදය, අර්බුදය )

(v) සම්මාන ( සාමර්ථය, සමර්ථ්‍යය)

(vi) සාහිත්‍ය (රශාස්වාදය, රසාස්වාදය )

(vii) පුළුල් (නළල, නලල)

(viii) මල්ලවපොර (සූරයා, ශූරයා)

(ix) (අළුත්, අලුත් ) ඇඳුම්

(x) (විෂ්මය ජනක, විස්මය ජනක) සිදුවීමකි

(ලකුණු:1×10=10 යි)

(06) පහත සඳහන් කවිවලට සුදුසු ඉතිරි පද දෙක ඔබ විසින් නිර්මාණය කරන්න.

(i) ඔවදන් දී මනා
රකී දෑසක් මෙනා
------------------------------------
------------------------------------

(ii) වනේ පුරා සොයා ගොසින් කෝටු කඩාලා
උදේ පටන් දවස පුරා කුඩු තනාලා
--------------------------------------------------------------------
--------------------------------------------------------------------

(iii) හරිත වන පෙතෙන් විසිරෙන සුවඳ නැවුම්
නිරිත දෙසින් හමනා මද සුළඟ සියුම්
--------------------------------------------------------------------
--------------------------------------------------------------------

(iv) කාලේ කුමට වහිනව නම් තෙමෙන්න
දෑලේ කුමට ගඟ හොඳ ඔරු පදින්න
--------------------------------------------------------------------
--------------------------------------------------------------------

(v) කපුටෙක් ඇවිත් මට වටකර කොටන්නා
ලේනෙක් ඇවිත් අතු අග සිට රවන්නා
--------------------------------------------------------------------
--------------------------------------------------------------------

(ලකුණු:2×5=10 යි)

(07) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ලේඛන ඉතිහාසයේ අවසන් අදියරේ දී අක්ෂර ලිපිය නිපදවා ගත් මිනිසාගේ අරමුණ වූයේ ලේඛනය මගින් කතා ශබ්ද විශ්වාසනීය ලෙස නියෝජනය කොට දැක්වීම යැයි කියයි.එය ඇත්තක් විය හැකි වුව ද, එම අරමුණ ස්ථිරව ම ඉටු කර ගත් භාෂක සමාජයක් කිසි කලෙක බිහි වූ බවට සාක්ෂි නැත. බොහෝ භාෂාවල ලේඛනයත් භාෂණයත් අතරෙහි වෙනස්කම් දක්නට ඇති අතර එය ජීව භාෂාවක එක් ලක්ෂණයකි. ලේඛනයෙන් තොර භාෂණ සමාජ ද ලොව ඇත. මේ නිසා ලේඛනය හා භාෂණය දෙඅංශයක් පැවතීම ද සජීවී භාෂා ලක්ෂණයකි. එක් භාෂක සමාජයක ලිපියක් වෙනත් භාෂක සමාජයකට පරිවර්තනය කිරීමේ දී ඇතිවන ගැටලු එබඳු නොගැළපීම්වලට එක් හේතුවකි. ඉක්මනින් වෙනස් වන ජීව භාෂාවක, භාෂණය හා සමගාමීව ලේඛනය වෙනස් නොවීම තවත් හේතුවකි. ස්වභාෂිකයාගේ ශබ්දෝච්චාරණ ක්‍රමය කෙරෙහි මිනිසාගේ ඇතැම් භාෂණ පුරුදු ද බලපා ඇත. ලිඛිත ව්‍යවහාරය හා කථික ව්‍යවහාරය අතරෙහි නිරායාසයෙන් ඇතිවන ඉහත පරතරය ඇතැම් භාෂා විසින් අඩු කර ගන්නේ යුගයෙන් යුගයට කරන ලේඛන ප්‍රතිසංස්කරණ මගිනි.

(i) ලේඛනය මගින් කතා ශබ්ද නියෝජනය කිරීම පිණිස මිනිසා නිපදවා ගත් මාධ්‍යය කුමක් ද?

(ii) මෙහි සඳහන් වන භාෂාවේ ප්‍රභේද දෙක නම් කරන්න.

(iii) ජීව භාෂාවක මූලික ලක්ෂණ දෙකක් ලියන්න.

(iv) භාෂණයත් ලේඛනයත් අතර පවත්නා වෙනස්කම් අඩු කොට ගැනීමට අනුගමනය කරන පියවරක් ලියන්න.

(v) අර්ථ ලියන්න.

(අ) සමගාමී -

(ආ) නිරායාසයෙන් -

(ලකුණු:2×5=10 යි)